ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2061/9 – 2018 මාර්තු 05 වැනි සඳුදා – 2018.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියතිලක කෝරළේ සුළු කොට්ඨාසයේ, හඟුරන්කෙත ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක එන්යූ/යූඩීඑච්/97/163 සහ 1997.12.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක 1 – පල්ලෙමළුව – **ප්‍රමාණය: හෙක්. 1.064**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන පල්ලේමළුව නමැති ඉඩම; දකුණට: කැබලි අංක 2, 3, 4 සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 13/97/ඊ/456.
2017 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 771

1A – G 27231 – 17 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*